## ජපන් තානාපති කාර්යාලය

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථන : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp


## පුවත්පත් නිවේදනය

මාර්තු 20, 2013

# ජපන් රජයෙන් අනුරාධපුර සහ මාතර දිස්ත්‍රික්කයන්හි ජීවනෝපායන් සහ යටිතල පහසුකම් නගා සිටුවීම සඳහා රුපියල් මිලියන 25.4 ක ආධාරයක්

ජපන් රජය විසින් බිම් මට්ටමේ මානව සුරැකීමේ ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ අනුරාධපුර සහ මාතර දිස්ත්‍රික්කයන්හි ප්‍රජාවගේ ජිවනෝපායන් සහ යටිතල පහසුකම් නගා සිටුවීම සඳහා ඇමරිකානු ඩොලර් 203,067 (දළ වශයෙන් රුපියල් මිලියන 25.4) ක් පරිත්‍යාග කරන ලදී.

අධාර ලබාදුන් එක් ව්‍යාපෘතියක් මාතර දිස්තික්කයේ දෙවුන්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම්මාන හතරක කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන අතර ඒ තුලින් මාථ වියලීම සඳහා උදුන් 30 ක් සකසා ඒ සඳහා අවශ්‍ය කරන උපකරණද ලබා දෙනු ඇත. මෙම ව්‍යාපෘතිය සෝබාකාන්තා පාරිසරික කළමණාකරණ හා ප්‍රජා සංවර්ධන පදනම හරහා ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා පරිත්‍යාග කරන මුදල රුපියල් මිලියන Rs.11.3 කි. ඒ තුලින් පවුල් 200කට පමණ සෘජුව ප්‍රතිලාභද ලැබෙනු ඇත. සෝබාකාන්තා සංවිධානය 2010 සහ 2011 වසර වල ආධාර කරන ලද ව්‍යාපෘති සාර්ථකව නිමා කල බැවින් මෙම ව්‍යාපෘතිය සඳහාද ජපන් රජය විසින් ආධාර සපයන ලදී.

සෝබාකාන්තා පාරිසරික කළමණාකරණ හා ප්‍රජා සංවර්ධන පදනමේ සභාපතිනි නිල්මිණී කාන්ති මුදලිගේ මහත්මිය පැවසුයේ මෙම ව්‍යාපෘතිය තුලින් කාන්තාවන්ගේ ජිවනෝපාය ඉහල නැංවිය හැකි බවත් එක් උදුනකින් මාසයකට උම්බලකඩ කිලෝග්‍රෑම් 250ක් පමණ නිෂ්පාදනය කල හැකි බවත්ය. වියලන ලද කරවල වල ප්‍රමිතිය වැඩි කර වෙළඳ පොලට හඳුන්වා දෙන නිසා එක් ප්‍රතිලාභියෙකුට මසකට රුපියල් 20,000 ක පමණ ශුද්ධ ලාබයක් ලබාගත හැකිවන බවද ඇය තව දුරටත් පැවසීය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේබ ගගුරන්නේපොතාන නම් වු ගම්මානයේ කුඹුරු අක්කර 200ක් පමණ වගා කල හැකි වසර 200ක් පමණ පැරණි වැවක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දෙවන ආධාරය ලබාදෙන ලදි ඒ සඳහා රුපියල් මිලියන 14.1 ක මුදලක් ප්‍රජාමුලික සම්පත් කළමණාකරණ පදනමට ලබාදුන් අතර ඒ තුලින් වැවේ ධාරිතාව වැඩිකර වැව් බැම්ම සොරොව්ව වාන් දොරටු ප්‍රතිසංස්කරණය කර නාන තොටුපළක් සහ ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීමද සිදු කෙරේ. ප්‍රජාමුලික සම්පත් කළමණාකරණ පදනමේ සභාපති ඒ විජේසුන්දර මහතා පැවසුයේ ගගුරන්පොතාන වැව අතිතයේදි අක්කර 200ක පමණ යල සහ මහ කන්නයන්හිදි වගා කිරීම සඳහා ජලය ලබා දුන් නමදු වැව වසර ගණනාවකින් ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා දැන් වගා කෙරෙන්නේ අක්කර 50ක් පමණ කුඹුරු ප්‍රමාණයක් බවය මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසුව තවත් අක්කර 150ක ප්‍රමාණයක වී වගාව යල මහ කන්න දෙකේදිම වගා කිරීමට බලාපොරොත්තු වන බවද ඔහු පැවසීය ඒ තුලින් ග්‍රාමීය ප්‍රජාවගේ අතමිට සරුවනවා පමණක් නොව රටේ ආරථිකය නගා සිටුවීමටත් පිටුවහලක් මෙම ව්‍යාපෘතිය නිසා ලැබෙන බවද ඔහු පැවසීය

ජපානය ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර නැවත ගොඩ නැගීමටත් කෘෂිකර්මය සහ ග්‍රාමීය සංවර්ධනය සඳහාත් අධාර ලබාදෙන අතර ඒ හරහා මෙම ව්‍යාපෘති සඳහාද ආධාර ලබාදුන්නේ ශ්‍රී ලංකාවේ සමාජයිය සහ ආර්ථිකමය සංවර්ධනය තුලින ග්‍රාමීය මට්ටමේ පටන් සාමය සහ සහයෝගිතාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් යුතුවය

ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතාත්, සෝබාකාන්තා පාරිසරික කළමණාකරණ හා ප්‍රජා සංවර්ධන පදනමේ සභාපතිනි එන් කේ මුදලිගේ මහත්මියත්, ප්‍රජාමුලික සම්පත් කළමණාකරණ පදනමේ සභාපති ඒ විජේසුන්දර මහතාත් අතර 2013 මාර්තු මස 20 වන දින තානාපති නිල නිවසේදි මෙම ආධාර ගිවිසුම් අත්සන් කරන ලදි


වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලයය

දුරකථන 011-2693831 දිගු අංකය 225

ඒ මේල් : cultujpn@co.mofa.go.jp